මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(*b*) පරීක්ෂණය සඳහා අවශ්‍ය අයිතම ඇටවීමට පෙර, දී ඇති එක්තරා අයිතමයකට අදාළ යම් දත්තයක් දැන තිබීම පහසු වේ. මෙම දත්තය කුමක් ද? මෙම දත්තය සඳහා දළ අගයක් ලබා ගැනීමට සරල ක්‍රමයක් විස්තර කරන්න.

.............................................................................................................

.............................................................................................................

(*c*) ඉහත (*a*) හි දැක්වූ ආකාරයට සියලු ම අයිතම අටවා ප්‍රතිබිම්බය දෙස බැලූ විට, ප්‍රතිබිම්බය සහ අන්වේෂණ කුර එක ම සිරස් රේඛාවක නොමැති බව ඔබ විසින් නිරීක්ෂණය කරන ලදැ'යි සිතන්න. මෙය සිදු වූයේ ඇයි දැ'යි දැක්වීමට, එකක් කුරුවලට අදාළ ව ද අනෙක කාචයට අදාළ ව ද වශයෙන් හේතු **දෙකක්** දෙන්න.

(i) කුරු :.............................................................................................................

(ii) කාචය :.............................................................................................................

(*d*) මෙම පරීක්ෂණයේ දී ඇස ප්‍රකාශ අක්ෂය හරහා දෙපසට ගෙන යාමේ දී ප්‍රතිබිම්බය ඇසෙහි චලිත දිශාවට විරුද්ධ දිශාවට ගමන් කරන බව ඔබ නිරීක්ෂණය කළේ යැ'යි සිතන්න. මෙම අවස්ථාවේ දී ප්‍රතිබිම්බය පිහිටන නිශ්චිත ස්ථානය සොයා ගැනීම සඳහා අන්වේෂණ කුර ගෙන යා යුත්තේ ඇස දෙසට ද නැතහොත් ඇසෙන් ඉවතට ද යන වග සඳහන් කරන්න.

.............................................................................................................

(*e*) වස්තු දුර, ප්‍රතිබිම්බ දුර සහ උත්තල කාචයෙහි නාභීය දුර පිළිවෙළින් $u$, $v$ සහ $f$ නම්, රේඛීය ප්‍රස්තාරයක් ඇඳීම මගින් කාචයෙහි නාභීය දුර නිර්ණය කිරීම සඳහා කාච සූත්‍රය නැවත සකසන්න. ඔබ කාච සූත්‍රය සඳහා භාවිත කළ ලකුණු සම්මුතිය සඳහන් කරන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

(*f*) ඉහත (*e*) හි ලබා ගත් සමීකරණයෙහි ස්වායත්ත විචල්‍යය දී ඇති රූප සටහනෙහි තිරස් අක්ෂයෙහි ද පරායත්ත විචල්‍යය සිරස් අක්ෂයෙහි ද ලකුණු කරන්න.

(*g*) බලාපොරොත්තු වන ප්‍රස්තාරයෙහි දළ සටහනක් එම රූප සටහනෙහි ම අඳින්න. වස්තු දුර සහ ප්‍රතිබිම්බ දුර සඳහා ඔබ (*e*) හි භාවිත කළ ලකුණු සම්මුතියට අදාළ ලකුණු භාවිත කරන්න.




4. (*a*) වි.ගා.බ. $E_0$ ($< E$) වූ සම්මත කෝෂයක අභ්‍යන්තර ප්‍රතිරෝධය $r_0$ නිර්ණය කිරීම සඳහා විද්‍යාගාරයේ භාවිත කරනු ලබන විභවමාන පරිපථයක අසම්පූර්ණ රූප සටහනක් (1) රූපයේ පෙන්වා ඇත.




(1) රූපය

(i) **සම්මත පරිපථ සංකේත** යොදා ගනිමින්, $P$ සහ $Q$ අතර පරිපථ කොටස සම්පූර්ණ කරන්න.

(ii) $R$ ප්‍රතිරෝධයක් ලබා ගැනීමට විද්‍යාගාරයේ දී $X$ සඳහා යොදා ගන්නා අයිතමය කුමක් ද?

.............................................................................................................

[හත්වැනි පිටුව බලන්න.

Alevel අපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(iii) විභවමාන කම්බියේ සංතුලන දිග $\ell$ ද විභවමාන කම්බියේ ඒකක දිගකට විභව බැස්ම $k$ ද නම්, $k\ell$ ගුණිතය සඳහා ප්‍රකාශනයක් $E_0$, $r_0$ සහ $R$ ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

...............................................................................................................

...............................................................................................................

...............................................................................................................

(*b*) පරිපථයේ $X$ අයිතමය, දිග $\ell_1$ වූ නික්‍රෝම් කම්බියක් මගින් ප්‍රතිස්ථාපනය කිරීමෙන් නික්‍රෝම් කම්බියෙහි ඒකක දිගකට ප්‍රතිරෝධය ($m_0$) නිර්ණය කිරීම සඳහා ඉහත ඇටවුම විකරණය කිරීමට ශිෂ්‍යයෙක් තීරණය කළේ ය.

(i) මෙම අවස්ථාවේ දී විභවමාන කම්බියේ සංතුලන දිග $\ell_2$ නම්, ඔබ (*a*)(iii) යටතේ දී ඇති ප්‍රකාශනය විකරණය කර $k\ell_2$ ගුණිතය සඳහා ප්‍රකාශනයක් $E_0$, $m_0$, $\ell_1$ සහ $r_0$ ඇසුරෙන් ලියන්න.

...............................................................................................................

...............................................................................................................

(ii) $\frac{1}{\ell_1}$ ස්වායත්ත විචල්‍යය ලෙස ගෙන, $\frac{1}{\ell_2}$ සහ $\frac{1}{\ell_1}$ අතර ප්‍රස්තාරයක් ඇඳීමට සුදුසු ආකාරයට ඔබ (*b*) (i) යටතේ දී ඇති ප්‍රකාශනය නැවත සකසන්න.

...............................................................................................................

...............................................................................................................

...............................................................................................................

(iii) ඉහත (*b*) (ii) හි සඳහන් කළ ප්‍රස්තාරයෙන් ලබා ගත් දත්ත සහ $r_0$ හි අගය භාවිතයෙන් ඔබ $m_0$ නිර්ණය කරන්නේ කෙසේ ද?

...............................................................................................................

...............................................................................................................

(iv) ශිෂ්‍යයාට ලබා දී ඇති නික්‍රෝම් කම්බියෙහි විෂ්කම්භය $1.6 \times 10^{-4}$ m නම්, 50 Ω ප්‍රතිරෝධයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කම්බියෙහි දිග ගණනය කරන්න. නික්‍රෝම්හි ප්‍රතිරෝධකතාව $10^{-6}$ Ω m වේ ($\pi$ හි අගය 3 ලෙස ගන්න).

...............................................................................................................

...............................................................................................................

(v) ප්‍රතිරෝධය 50 Ω වූ නික්‍රෝම් කම්බිය, මීටර කෝදුවක් මත සවිකර ඇත. ඉහත (*b*) (ii) හි සඳහන් කළ ප්‍රස්තාරය භාවිතයෙන් $m_0$ නිර්ණය කිරීම සඳහා විභවමානයෙන් මිනුම් කට්ටලයක් ලබා ගැනීමට ඔබට පවසා ඇත. නික්‍රෝම් කම්බියේ ආසන්න වශයෙන් 25 Ω ට අනුරූප දිගක් සඳහා අදාළ මිනුම ලබා ගැනීමට ඔබ නික්‍රෝම් කම්බිය විභවමාන පරිපථයට සම්බන්ධ කරන්නේ කෙසේ දැ'යි පහත (2) රූපයේ දී ඇති පරිපථය සම්පූර්ණ කිරීම මගින් පෙන්වන්න.




නික්‍රෝම් කම්බිය (2) රූපය මීටර කෝදුව

* *

[අනෙක් පිටුව බලන්න.

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

4. (*a*) වි.ගා.බ. $E_0$ ($< E$) වූ සම්මත කෝෂයක අභ්‍යන්තර ප්‍රතිරෝධය $r_0$ නිර්ණය කිරීම සඳහා විද්‍යාගාරයේ භාවිත කරනු ලබන විභවමාන පරිපථයක අසම්පූර්ණ රූප සටහනක් (1) රූපයේ පෙන්වා ඇත.




(1) රූපය

(i) **සම්මත පරිපථ සංකේත** යොදා ගනිමින්, $P$ සහ $Q$ අතර පරිපථ කොටස සම්පූර්ණ කරන්න.




හෝ




................................ **(ලකුණු 01)**

[පිළිගත හැකි අනෙකුත් ස්විච්චි සංකේත  හෝ  හෝ  ]

(මෙම ලකුණ ලබා ගැනීමට අයිතම **තුනම** ඇඳ තිබිය යුතුයි)

(ii) $R$ ප්‍රතිරෝධයක් ලබා ගැනීමට විද්‍යාගාරයේ දී $X$ සඳහා යොදා ගන්නා අයිතමය කුමක් ද?

ප්‍රතිරෝධ පෙට්ටිය .................................................................................... **(ලකුණු 01)**

(අනෙකුත් අයිතම සඳහා ලකුණු නැත.)

(iii) විභවමාන කම්බියේ සංතුලන දිග $\ell$ ද විභවමාන කම්බියේ ඒකක දිගකට විභව බැස්ම $k$ ද නම්, $k\ell$ ගුණිතය සඳහා ප්‍රකාශනයක් $E_0$, $r_0$ සහ $R$ ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

$$V_{AB} = \frac{E_o R}{r_o + R}$$ ....................................................................................... **(ලකුණු 01)**

$$kl = \frac{E_o R}{r_o + R}$$ ....................................................................................... **(ලකුණු 01)**

(ඕනෑම නිවැරදි ව්‍යුත්පන්නයකට ලකුණු ප්‍රදානය කරන්න.)

(*b*) පරිපථයේ $X$ අයිතමය, දිග $\ell_1$ වූ නික්‍රෝම් කම්බියක් මගින් ප්‍රතිස්ථාපනය කිරීමෙන් නික්‍රෝම් කම්බියෙහි ඒකක දිගකට ප්‍රතිරෝධය ($m_0$) නිර්ණය කිරීම සඳහා ඉහත ඇටවුම විකරණය කිරීමට ශිෂ්‍යයෙක් තීරණය කළේ ය.

(i) මෙම අවස්ථාවේ දී විභවමාන කම්බියේ සංතුලන දිග $\ell_2$ නම්, ඔබ (*a*)(iii) යටතේ දී ඇති ප්‍රකාශනය විකරණය කර $k\ell_2$ ගුණිතය සඳහා ප්‍රකාශනයක් $E_0$, $m_0$, $\ell_1$ සහ $r_0$ ඇසුරෙන් ලියන්න.

$$kl_2 = \frac{E_o m_o l_1}{r_o + m_o l_1}$$ ............................................................................ **(ලකුණු 01)**

(නිවැරදි ඕනෑම ආකාරයක්)

(ii) $\frac{1}{\ell_1}$ ස්වායත්ත විචල්‍යය ලෙස ගෙන, $\frac{1}{\ell_2}$ සහ $\frac{1}{\ell_1}$ අතර ප්‍රස්තාරයක් ඇඳීමට සුදුසු ආකාරයට ඔබ (*b*) (i) යටතේ දී ඇති ප්‍රකාශනය නැවත සකසන්න.

$$\frac{1}{kl_2} = \frac{r_o + m_o l_1}{E_o m_o l_1}$$

$$\frac{1}{l_2} = \frac{kr_o}{E_o m_o} \cdot \frac{1}{l_1} + \frac{k}{E_o}$$ ............................................................................ **(ලකුණු 01)**

(iii) ඉහත (*b*) (ii) හි සඳහන් කළ ප්‍රස්තාරයෙන් ලබා ගත් දත්ත සහ $r_0$ හි අගය භාවිතයෙන් ඔබ $m_0$ නිර්ණය කරන්නේ කෙසේ ද?

$$\frac{m_0}{r_0} = \frac{\text{අන්තඃඛණ්ඩය}}{\text{අනුක්‍රමණය}} \quad \text{හෝ} \quad m_0 = r_0 \frac{\text{අන්තඃඛණ්ඩය}}{\text{අනුක්‍රමණය}}$$ .............. **(ලකුණු 01)**

(iv) ශිෂ්‍යයාට ලබා දී ඇති නික්‍රෝම් කම්බියෙහි විෂ්කම්භය $1.6 \times 10^{-4}$ m නම්, 50 Ω ප්‍රතිරෝධයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කම්බියෙහි දිග ගණනය කරන්න. නික්‍රෝම්හි ප්‍රතිරෝධකතාව $10^{-6}$ Ω m වේ ($\pi$ හි අගය 3 ලෙස ගන්න).

$$R = \frac{\rho l}{A} \quad \text{හෝ} \quad l = \frac{RA}{\rho} \quad \text{හෝ} \quad l = \frac{50 \times [\,3 \times (0.8 \times 10^{-4})^2]}{10^{-6}}$$

$l = 0.96$ m හෝ 96 cm ............................................................................ **(ලකුණු 01)**

($\pi$ හි අගය 3.14 ලෙස ගෙන ඇත්නම් පිළිතුර 1.0 m වේ.) ආදේශය නිවැරදි විය යුතුයි **(ලකුණු 01)**

(v) ප්‍රතිරෝධය 50 Ω වූ නික්‍රෝම් කම්බිය, මීටර කෝදුවක් මත සවිකර ඇත. ඉහත (*b*) (ii) හි සඳහන් කළ ප්‍රස්තාරය භාවිතයෙන් $m_0$ නිර්ණය කිරීම සඳහා විභවමානයෙන් මිනුම් කට්ටලයක් ලබා ගැනීමට ඔබට පවසා ඇත. නික්‍රෝම් කම්බියේ ආසන්න වශයෙන් 25 Ω ට අනුරූප දිගක් සඳහා අදාළ මිනුම ලබා ගැනීමට ඔබ නික්‍රෝම් කම්බිය විභවමාන පරිපථයට සම්බන්ධ කරන්නේ කෙසේ දැ'යි පහත (2) රූපයේ දී ඇති පරිපථය සම්පූර්ණ කිරීම මගින් පෙන්වන්න.




(නික්‍රෝම් කම්බියේ $O$ සහ $C$ ලක්ෂ්‍ය විභවමාන පරිපථයේ $X$ සහ $Y$ ලක්ෂ්‍යවලට සම්බන්ධ කර තිබිය යුතුය. මීටර කෝදුව මත ආසන්න ලෙස 25 cm සහ 75 cm සලකුණු අතර ඕනෑම ලක්ෂ්‍යයක් $C$ සඳහා නිවැරදි ලක්ෂ්‍යයක් ලෙස පිළිගන්න.) **(ලකුණු 01)**